# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 38 දරන මහා නගර සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1973 සැප්තැම්බර් මස 13 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1973 සැප්තැම්බර් මස 21 වන දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබා ගත හැකිය.

## ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 38 දරන
## මහා නගර සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1973 සැප්තැම්බර් මස 13 වන දින]

ඇල්.ඩී.—ඕ. 5/68

**මහා නගර සභා ආඥාපනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 38 දරන මහා නගර සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) මහා නගර සභා ආඥාපනතේ 323 වැනි වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 252 වැනි අධිකාරයේ 323 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි (1) වැනි උපවගන්තිය වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) කොළඹ මහා නගර සභා ජල කර්මාන්ත ආඥාපනතේ 9, 10, 12, 17, 18, 19, 20, 21, 22, 23, 24, 33 හා 34 වැනි වගන්ති ගාල්ලේ මහා නගර සභා ප්‍රදේශයට අදාළ විය යුතුය.";

(2) එහි (3) වැනි උපවගන්තිය වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(3) ගාල්ලේ මහා නගර සභාව විසින් එකී කොළඹ මහා නගර සභා ජල කර්මාන්ත ආඥාපනතෙහිවූ උපලේඛනයේ ඇතුළත් නියෝගවලින් කිසිවක්, අවස්ථාව අනුව අවශ්‍ය විය හැකි වෙනස් කිරීම් සහිත ව ගාල්ලේ මහා නගර සභා ප්‍රදේශයට අදාළ කිරීම මේ ආඥාපනතෙන් විධිවිධාන සැලැස්වෙන ආකාරයෙන් සාදා පළ කරනු ලබන අතුරු ව්‍යවස්ථා මගින් කළ හැකිය."; තවද

(3) ඒ වගන්තියේ පාර්ශ්ව සටහන වෙනුවට පහත සඳහන් අලුත් පාර්ශ්ව සටහන ආදේශ කිරීමෙන් :—

"කොළඹ මහා නගර සභා ජල කර්මාන්ත ආඥාපනතේ ඇතැම් කොටස් ගාල්ලට අදාළ කිරීම.".

ඒ 00052—9,850 (73/09)

323අ සහ 323ආ වැනි අලුත් වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියෙහි අන්තර්ගත කිරීම.

3. පහත සඳහන් අලුත් වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියේ 323 වැනි වගන්තියට ඉක්බිතිව ම මෙයින් අන්තර්ගත කරනු ලබන අතර ඒවා 323 අ සහ 323 ආ වැනි වගන්ති ලෙස බලපැවැත්විය යුතුය :—

"කොළඹ මහා නගර සභා ජල කර්මාන්ත ආඥාපනතේ ඇතැම් විධිවිධාන මහනුවරට අදාළකිරීම.

323 අ. (1) මෙහි එකොළොස් වැනි උපලේඛනයේ දක්වෙන වෙනස් කිරීම්වලට යටත් ව, කොළඹ මහා නගර සභා ජල කර්මාන්ත ආඥාපනතේ 3, 4, 7 වැනි වගන්ති හා 9 සිට 44 දක්වා වූ (දෙක ම ඇතුළු ව) වගන්ති ද එහි උපලේඛනයේ දක්වෙන නියෝග ද මහනුවර මහා නගර සභා ප්‍රදේශයට අදාළ විය යුතුය.

(2) (1) වැනි උපවගන්තිය මගින් මහනුවර මහා නගර සභා ප්‍රදේශයට අදාළ කෙරෙන විධිවිධාන හා ජල කර්මාන්ත සම්බන්ධයෙන් ඒ මහා නගර සභා ප්‍රදේශයට අදාළ වන අතුරු ව්‍යවස්ථා කිසිවක විධිවිධාන අතර යම් ගැටුමක් හෝ නොගැළපීමක් ඇති වූ විටක, (1) වැනි උපවගන්තිය මගින් අදාළ කෙරෙන විධිවිධාන, ඒ ගැටුම හෝ නොගැළපීම ඇතිතාක් දුර ඒ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන අභිභවා බලපැවැත්විය යුතුය.

කොළඹ මහා නගර සභා ජල කර්මාන්ත ආඥාපනතේ විධිවිධාන මහා නගර සභාවලට අදළ කිරීමෙහි ලා අමාත්‍යවරයාට ඇති බලය.

323 ආ. අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් කොළඹ මහා නගර සභා ජල කර්මාන්ත ආඥාපනතේ විධිවිධාන සියල්ල හෝ එයින් කිසිවක් යම් මහා නගර සභා ප්‍රදේශයක අවශ්‍යතාවන් සපුරාලනු පිණිස, නියමයෙහි දක්විය හැකි වෙනස් කිරීම් සහිතව, ඒ මහා නගර සභා ප්‍රදේශයට අදළ කළ හැකිය.".

එකොළොස් වැනි උපලේඛනය ප්‍රධාන ප්‍රඥප්තියට අන්තර්ගත කිරීම.

4. පහත දැක්වෙන අලුත් උපලේඛනය දහවැනි උපලේඛනයට ඉක්බිතිවම මෙයින් අන්තර්ගත කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ එකොළොස් වැනි උපලේඛනය ලෙස බලපැවැත්විය යුතුය :—

### එකොළොස් වැනි උපලේඛනය

### (323අ වැනි වගන්තිය)

කොළඹ මහා නගර සභා ජල කර්මාන්ත ආඥාපනතේ විධිවිධාන මහනුවර මහා නගර සභා ප්‍රදේශයට අදාළ කිරීමෙහි ලා ඒවා වෙනස් කිරීම.

(1) 7 වැනි වගන්තියෙහි—

(අ) "කොළඹ මහා නගර සභා ප්‍රදේශය," යන යෙදුම වෙනුවට "මහනුවර මහා නගර සභා ප්‍රදේශය," යන යෙදුම ආදේශ කරන්න ;

(ආ) "කොළඹ මහා නගර සභා ප්‍රදේශයේ," යන යෙදුම වෙනුවට "මහනුවර මහා නගර සභා ප්‍රදේශයේ," යන යෙදුම ආදේශ කරන්න; තව ද

(ඇ) "මහා නගර සභා ප්‍රදේශය තුළ වෙසෙන්නන් විසින් ගෘහ්‍ය කාර්යයන් සඳහා නොමිලේ ප්‍රයෝජනයට ගැනීම පිණිස පහසුකම් සැලසෙන සේ ජලකණු, වතුරමල්, විවෘත ජලාශ හෝ පොම්ප ඒ වීථිවල ඉදි කළ යුතුය" යන යෙදුම වෙනුවට "පහසුකම් සැලසෙන සේ ජලකණු, වතුරමල්, විවෘත ජලාශ හෝ පොම්ප ඒ වීථිවල ඉදිකළ යුතුය" යන යෙදුම ආදේශ කරන්න.

(2) 13 වැනි වගන්තියේ "හා මේ ආඥාපනතින් සභාව වෙත පැවරෙන" යන යෙදුම අත් හරින්න.

(3) 14 වැනි වගන්තියේ "කොළඹ මහා නගර සභා ප්‍රදේශය" යන යෙදුම වෙනුවට "මහනුවර මහා නගර සභා ප්‍රදේශය" යන යෙදුම ආදේශ කරන්න.

(4) 15 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ "කොළඹ රික්වෙස්ට් අධිකරණයේ කොමසාරිස්වරයා විසින්" යන යෙදුම වෙනුවට "මහනුවර රික්වෙස්ට් අධිකරණයේ කොමසාරිස්වරයා විසින්" යන යෙදුම ආදේශ කරන්න.

(5) 21 වැනි වගන්තියේ "ගෘහ්‍ය නොවන කාර්යයන් සඳහා" යන යෙදුම අත්හරින්න.

(6) 44 වැනි වගන්තියේ—

(අ) "කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණයේ" යන යෙදුම වෙනුවට "මහනුවර මහෙස්ත්‍රාත් අධිකරණයේ" යන යෙදුම ආදේශ කරන්න; තව ද

(ආ) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනෙහි "කොළඹ මහෙස්ත්‍රාත්ගේ" යන යෙදුම වෙනුවට "මහනුවර මහෙස්ත්‍රාත්ගේ" යන යෙදුම ආදේශ කරන්න.

(7) එහි උපලේඛනයේ—

(අ) 4 වැනි නියෝගයේ "මේ උපලේඛනයේ 'අ' ආකෘතිය අනුව මහා නගර සභාව සමග කලින් ගිවිසුමකට ඇතුළත් ව නොසිටියහොත්" යන වචනවල සිට ඒ නියෝගයෙහි අග දක්වා වූ සියලු ම වචන හා ඉලක්කම් වෙනුවට පහත සඳහන් ඡේද ආදේශ කරන්න;—

"අවස්ථාවෝචිත පරිදි මේ උපලේඛනයේ 'අ' ආකෘතිය හෝ 'එ' ආකෘතිය අනුව මහා නගර සභාව සමග කලින් ගිවිසුමකට ඇතුලත් ව නොසිටියහොත්, යම් පෞද්ගලික සේවයකින් ඇදගත් ජලය යම් කර්මාන්තයක්, නිෂ්පාදනයක් හෝ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් හෝ යම් සැරයිලි හෝ යාන්ත්‍රික කාර්යයක් සඳහා හෝ ඉඩම්වලට ජලය සැපයීමේ කාර්යයන් සඳහා පාවිච්චි නොකළ යුතුය:

එසේ වුවද එබඳු ගිවිසුමක් ඇති කර ගත්නාතුරු සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථා යටතේ යම් තැනැත්තකු විසින් සභාව සමග ඇති කර ගත් යම් ගිවිසුමක් සියලු ම කාර්යයන් සඳහා මේ නියෝග යටතේ ඇති කරගත් ගිවිසුමක් ලෙස සැලකිය යුතුය.";

(ආ) 4 වැනි නියෝගයට ඉක්බිති ව ම පහත සඳහන් අලුත් නියෝගය අන්තර්ගත කරන්න :—

"4අ. අයිතිකරු හෝ පදිංචිකරු විසින් මහා නගර සභාව සමග මේ උපලේඛනයේ අදාළ විය හැකි 'උ' හෝ 'ඌ' ආකෘතියෙහි වූ ගිවිසුමකට කලින් ඇතුළත් ව නොසිටියහොත්, ගෘහ්‍ය කාර්යයන් සඳහා කිසිම අයිතිකරුවකුට හෝ පදිංචිකරුවකුට පෞද්ගලික ජල සේවයක් ලබා නොදිය යුතුය.";

(ඇ) 17 වැනි නියෝගය වෙනුවට පහත සඳහන් අලුත් නියෝගය ආදේශ කරන්න :—

"17. යම් සේවයක් ඉදි කිරීමෙහි ලා පාවිච්චි කරනු ලබන සියලු ම නල හා සවි කළ යුතු දේ මේ නියෝගවල අන් ලෙසකින් නිශ්චය කොට නොමැත හොත් ජල කර්මාන්ත ඉංජිනේරු තැන විසින් අනුමත කරන ලද ඝනකමින් හා ස්වභාවයෙන් යුක්ත විය යුතුය.";

(ඈ) 31 වැනි නියෝගයෙහි "ගෘහ්‍ය නොවන කාර්යයන් සඳහා" යන යෙදුම වෙනුවට "ගෘහ්‍ය හෝ ගෘහ්‍ය නොවන කාර්යයන් සඳහා" යන යෙදුම ආදේශ කරන්න;

(ඉ) 32, 33, 34, 35 සහ 36 වැනි නියෝග වෙනුවට පහත සඳහන් නියෝග ආදේශ කරන්න :—

"32. සම්පූර්ණයෙන් හෝ කොටසක් පහත සඳහන් කාර්යයන් සඳහා පරිහරණය කරන ගොඩනැගිල්ලකට සපයනු ලබන ජලය ගෘහ්‍ය නොවන කාර්යයන් සඳහා සැපයෙන ලෙස සැලකිය යුතුය. එනම් :—

(අ) 1 වැනි පන්තියේ වාණිජ කාර්යයන්— සේවයෙහි නියුක්ත හෝ සේවයෙහි යොදනු ලද තැනැත්තන්ගේ හුදු යහපත සඳහා ජලය පාවිච්චි කරනු ලබන පෞද්ගලික දන්ත රෝග චිකිත්සාගාර, පෞද්ගලික සත්තු නිවාස, පෞද්ගලික ආරෝග්‍යශාලා, පෞද්ගලික බෙහෙත් ශාලා සහ පෞද්ගලික ශල්‍යාගාර ඇතුළු ව, යම් කර්මාන්තයක් හෝ නිෂ්පාදනාගාරයක් පවත්වාගෙන යාමේ හෝ කර ගෙන යාමේ කාර්යයන්.

(ආ) 2 වැනි පන්තියේ වාණිජ කාර්යයන්— කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් වැඩි දියුණු කිරීමෙහි ලා ඉහත 1 වැනි පන්තියේ සඳහන් තැනැත්තන් නොවන තැනැත්තන්හට ආහාරපාන සැපයීම සඳහා ජලය පාවිච්චි කරනු ලබන යම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම; ඒ කර්මාන්තයට හෝ ව්‍යාපාරයට පහත සඳහන් ස්ථාන ඇතුළත් වේ :—

1. හෝටල් සහ බේකරි.
2. බත්කඩ.
3. භෝජනාගාර.
4. ආපනශාලා.
5. (අධ්‍යාපනික හෝ ආගමික ආයතන වලට අනුබද්ධ බෝඩිම් නොවන) පෞද්ගලික බෝඩිම්.
6. (වන්දනාකරුවන්ගේ විශ්‍රාමශාලා නොවන) පෞද්ගලික නවාතැන්.
7. පෞද්ගලික නේවාසිකාගාර හෝ ආගන්තුක නිවාස.
8. සුරාපාන ශාලා.
9. තැබෑරුම්.
10. කිරිහල්.
11. අයිස්ක්‍රීම් කඩ.
12. ඡායාරූපශාලා.
13. කැන්ටින්.
14. කෑනිවල්.
15. පොළවල්.

16. සමාජශාලා.
17. සිනමාහල්.
18. නෘත්‍යශාලා.
19. විනෝද ස්ථාන.
20. බැටරි (විදුලිය ගබඩා කිරීමේ සෙල) අලුත්වැඩියා කරන්නෝ.
21. (මහා නගර සභාවේ ප්‍රධාන වෙළඳ සැලේ එළවළු කඩ නොවන) එළවළු කඩ.
22. (මහා නගර සභාවේ ප්‍රධාන වෙළඳ සැලේ මල්කරුවන් නොවන) මල් කරුවෝ.
23. (මහා නගර සභාවේ ප්‍රධාන වෙළඳ සැලේ පැළ වෙළඳ සැල් නොවන) පැළ වෙළඳ සැල්.
24. ගොඩනැගිලි වැඩ, මහා නගර සභා පාර වල් නොවන පාරවල් තැනීමේ හෝ අලුත්වැඩියා කිරීමේ කාර්යයන්.
25. නිර්මාණාත්මක වැඩ.
26. බාබර් සාප්පු.
27. මුදල් ගෙවා ජල ස්නානය කිරීමේ ස්ථාන.
28. යම් සේවා නලයකට හෝ ප්‍රධාන නලය කට නිත්‍ය ලෙස හෝ තාවකාලික ලෙස විශේෂ උපකරණ හෝ සම්බන්ධක සවිකර ඇති ස්ථාන, පිහිනුම් තටාක නැතහොත් ගෙවතුවලට හෝ ගෙමිදුල්වලට ජලය සැපයීමේ කටයුතු.
29. මත්ස්‍ය තටාක.
30. කිරිපට්ටි.
31. ඌරුකොටු, අශ්වයන් හා ගවයන් ඇති කරන ස්ථාන.
32. මේ වර්ගයට ඇතුළත් වෙතැයි කලින් කල සභාව විසින් යෝජනාවක් මගින් ප්‍රකාශයට පැමිණවිය හැකි වෙනත් කර්මාන්ත හෝ ව්‍යාපාර.

(ඇ) කාර්මික කාර්යයන්—ප්‍රධාන වශයෙන් ජලය මත රඳා පවතින, යම් කර්මාන්තයක් හෝ නිෂ්පාදනාගාරයක් පවත්වාගෙන යාම හෝ කරගෙන යාම. ඒ කර්මාන්තයට හෝ නිෂ්පාදනාගාරයට පහත සඳහන් ස්ථාන ඇතුළත් වේ:—

1. යන්ත්‍ර සිසිල් කිරීම හෝ වාෂ්ප උත්පාදනය කිරීම සඳහා ජලය උපයෝගී කර ගන්නා කර්මාන්ත ශාලා.

2. නිෂ්පාදිත සෑදීම සඳහා ජලය උපයෝගී කරගන්නා කර්මාන්ත ශාලා.
3. සිසිල් බීම කර්මාන්ත ශාලා.
4. අයිස් කර්මාන්ත ශාලා.
5. සායම් කර්මාන්ත.
6. ලොන්ඩරි.
7. සිරප් කර්මාන්ත ශාලා සහ වියලි ද්‍රව්‍ය වින් කිරීම නොවන වින් කිරීමේ කර්මාන්ත.
8. පවත්වාගෙන යනු ලබන කර්මාන්ත සම්බන්ධයෙන් වාහන, යන්ත්‍ර සහ වෙනත් උපකරණ සේදීම සඳහා ජලය පාවිච්චි කරන මෝටර් වාහන සර්විස් කරන ස්ථාන, ගරාජ් සහ වැඩ පොළවල්.
9. හම් පදම් කරන ස්ථාන.
10. සිමෙන්ති කොන්ක්‍රීට් බඩු සාදන ස්ථාන.
11. බෝතල් සෝදන සාප්පු සහ ඉස්කාගාර.
12. මත්පැන් නිෂ්පාදනාගාර.
13. රසායන ද්‍රව්‍ය නිෂ්පාදනාගාර.
14. විද්‍යුත්ලෝහාලේපන කර්මාන්ත.
15. සබන් කර්මාන්තශාලා.
16. ශීතකරණ ආගාර.
17. සකස් කිරීමේ හා ඇහිරීමේ ආයතන.
18. ගඩොල්, උළු සහ පිඟන් කර්මාන්ත ශාලා.
19. මේ වර්ගයට ඇතුළත් වෙතැයි කලින් කල සභාව විසින් යෝජනාවක් මගින් ප්‍රකාශයට පැමිණවිය හැකි වෙනත් කර්මාන්ත.

33. පළාත් පාලන ආයතනවලට, ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවට, නැව් සමාගම්වලට විශාල ප්‍රමාණවලින් සැපයෙන සියලු ම ජලය හා මේ වර්ගයට ඇතුළත් වෙතැයි කලින් කල සභාව විසින් යෝජනාවක් මගින් ප්‍රකාශයට පැමිණවිය හැකි වෙනත් විශාල ප්‍රමාණවලින් සැපයෙන ජලය, ගෘහ්‍ය කාර්යයන් නොවන කාර්යයන් සඳහා සපයනු ලබන ජලය ලෙස සැලකිය යුතුය.

34. මෙහි මින් පෙර සඳහන් කරන ලද වර්ගවලට ඇතුළත් නොවන සෑම පෞද්ගලික ජල සේවයක් ම ගෘහ්‍ය කාර්යයන් සඳහා වූ ජල සම්පාදන ලෙස සැලකිය යුතුය.

35. මීටර් මාර්ගයෙන් ස්ථානවලට සපයනු ලබන ජලය පිළිබඳ මිල පහත දැක්වෙන පරිදි විය යුතුය :—

(අ) 1 වැනි පන්තියට ඇතුළත් වාණිජ කාර්ය යන් සඳහා ගැලුම් 1000 කට රු. 1.50 ;

2 වැනි පන්තියට ඇතුළත් වාණිජ කාර්ය යන් සඳහා ගැලුම් 1000 කට රු. 1.05.

(ආ) කාර්මික කාර්යයන් සඳහා ගැලුම් 1000 කට රු. 1.65.

(ඇ) විශාල ප්‍රමාණවලින් සැපයෙන ජලය සඳහා ගැලුම් 1000 කට රු. 1.30.

(ඈ) ඒකාබද්ධ වරිපනම්, හෝ ඒ වෙනුවට නියමිත මුදලක්, නොගෙවිය යුතු ස්ථාන සම්බන්ධයෙන් ගෘහ්‍ය කාර්යයන් සඳහා සැපයෙන ජලය වෙනුවෙන් සභාව විසින් කලින් කල යෝජනාවක් මගින් නියම කළ හැකි ප්‍රමාණ අනුව වූ ගාස්තුවක් සභාව විසින් අය කරනු ලැබිය හැකිය.

(ඉ) 'ඈ' ඡේදයෙහි සඳහන් ස්ථාන හැර ගෘහ්‍ය කාර්යයන් සඳහා ගැලුම් 1000කට රු. 1.00.

(ඊ) මාසයකට වැඩි නොවූ කාලයක් තාවකාලික ලෙස සැපයෙන ජලය වෙනුවෙන් ගැලුම් 1000 කට රු. 1.65.

36. මීටර් මාර්ගයෙන් හැර අන් ලෙසකින් ජලය සපයනු ලබන අවස්ථාවක, තාවකාලික මීටරයක් මගින් හෝ ජල කර්මාන්ත ඉංජිනේරු තැන විසින් නිශ්චය කෙරෙන පරිදි ස්ථානවල පාවිච්චි කෙරෙතැයි පෙනෙන ජල ප්‍රමාණය පදනම් කොටගත් තක්සේරුවක් සභාව විසින් කළ හැකිය." ;

(ඊ) 40 වැනි නියෝගයෙහි "35 (5) වැනි නියෝගයෙහි," යන යෙදුම වෙනුවට "36 වැනි නියෝගයෙහි," යන යෙදුම ආදේශ කරන්න ;

(උ) 'අ' සහ 'ඉ' ආකෘතිවල "කොළඹ මහා නගර සභාව" යන යෙදුම වෙනුවට "මහනුවර මහා නගර සභාව" යන යෙදුම ආදේශ කරන්න ;

(ඌ) 'අ' ආකෘතියෙහි—

(i) 4 වැනි ඡේදයේ "හා ඒ යටතේ පනවන ලද නියෝගවල විධිවිධාන" යන යෙදුම වෙනුවට "හා ඒ යටතේ පනවන ලද නියෝගවල විධිවිධාන මහනුවර මහා නගර සභාවට අදාළ වනතාක්" යන යෙදුම ආදේශ කරන්න ; තව ද

(ii) "කොළඹ දී අත්සන් කරන ලදී." යන යෙදුම එන කවර තැනක වුව ද ඒ වෙනුවට "මහනුවර දී අත්සන් කරන ලදී." යන යෙදුම ආදේශ කරන්න.

(එ) 'ආ', 'ඇ', 'ඉ' සහ 'ඊ' ආකෘතිවල "19......මස......වැනි දින කොළඹ දීය." යන යෙදුම වෙනුවට "19.........මස............වැනි දින මහනුවර දීය." යන යෙදුම ආදේශ කරන්න;

(ඒ) 'ඇ' ආකෘතියෙහි "කොළඹ, ජල කර්මාන්ත ඉංජිනේරු නැන වේතය." යන යෙදුම වෙනුවට "මහනුවර, ජල කර්මාන්ත ඉංජිනේරු නැන වේතය." යන යෙදුම ආදේශ කරන්න;

(ඔ) 'ඉ' ආකෘතියෙහි "කොළඹ මහා නගර සභාව" යන යෙදුම වෙනුවට "මහනුවර මහා නගර සභාව" යන යෙදුම ආදේශ කරන්න; තවද

(ඕ) 'ඊ' ආකෘතියට ඉක්බිති ව ම පහත දැක්වෙන අලුත් ආකෘති අන්තර්ගත කරන්න:—

"උ" ආකෘතිය

(4අ වැනි නියෝගය)

ගෘහ්‍ය කාර්යයන් සඳහා ජලය සැපයීම පිණිස වූ ගිවිසුම

(මෙහි මින් මතු "අයිතිකරු" යනුවෙන් හඳුන්වනු ලබන)..........................

..........................................................................

..........................................................................

(සම්පූර්ණ නම)

එක් පාර්ශ්වයකට ද මහනුවර මහා නගර සභාව අනික් පාර්ශ්වයට ද ඇති ව,...

....................................... පිහිටි අංක..................... දරන ස්ථානයට ගෘහ්‍ය කාර්යයන් සඳහා මීටර් මාර්ගයෙන් හෝ අන් ලෙසකින් ජලය සැපයීම පිණිස ඇති කර ගන්නා ලද ගිවිසුමකි.

2. ගෘහ්‍ය කාර්යයන් සඳහා එකී ස්ථානයට ජලය සැපයීම අනුමත කිරීම සැලකිල්ලට ගෙන, මෙහි මින් මතු සඳහන් කෙරෙන කොන්දේසි පිළිපැදීමට අයිතිකරු මෙයින් එකඟවෙයි:—

(අ) අඟල්..................මීටරයක් මඟින් ජලය සැපයිය යුතුය.

(ආ) අයිතිකරු විසින් මහනුවර මහා නගර සභාවට මීටර් කුලිය වශයෙන් රුපියල් .......................................................... ත්‍රෛමාසිකව ගෙවිය යුතුය, නැතහොත් ගෙවීමට සැලැස්විය යුතුය.

(ඇ) එක් එක් මාසය තුළ සපයන ලද ජල ප්‍රමාණය වෙනුවෙන් ගැලුම් දහසකට රුපියල් ...................................................... බැගින් අයිතිකරු විසින් මහනුවර මහා නගර සභාවට ගෙවිය යුතුය; නැතහොත් ගෙවීමට සැලැස්විය යුතුය.

3. (මහා නගර සභාවේ ජල කර්මාන්ත ඉංජිනේරු නැන විසින් ස්ථාපනය කරන ලද්දේ නම්) ඒ පෞද්ගලික ජල සේවාවල ඇස්තමේන්තු කළ පිරිවැය, මීටරය හෝ මීටර් සවි කිරීමේ පිරිවැය හා සභාව විසින් අනාගතයේදී කරනු ලබන අලුත් වැඩියා කිරීම, විශාල කිරීම හා වෙනස් කිරීම් සියල්ල පිළිබඳ ඇස්තමේන්තු කළ පිරිවැය ද, මහා නගර සභාවේ ජල කර්මාන්ත ඉංජිනේරු නැන විසින් ඉල්ලා සිටි කල්හි, අයිතිකරු විසින් ගෙවිය යුතුය.

4. මීටර් කුලිය හෝ සපයන ලද ජලය සඳහා වූ ගාස්තුව ගෙවිය යුතු දින සිට දින තිහක් ඇතුළත මහා නගර සභාව වෙත ගෙවනු නොලැබුවහොත් වෙනම සේවාවක් ලැබීමේ අයිතිවාසිකම අහිමි විය යුතු අතර මහා නගර සභාව විසින් සැපයුම නවත්වා දැමිය හැකිය.

5. කොළඹ මහා නගර සභා ජල කර්මාන්ත ආඥාපනතේ විධිවිධාන හා ඒ යටතේ සාදන ලද නියෝගවල විධිවිධාන මහනුවර මහා නගර සභාවට අදාළ වන තාක් ඒවා මේ ගිවිසුමේ කොටසක් ලෙස ගත යුතු අතර ඉන්පසු එකී ආඥාපනතේ වගන්ති කිසිවක් යටතේ සෑදිය හැකි යම් නියෝගවලින් ද මේ ගිවිසුමේ පාර්ශ්වකරුවන් බැඳී සිටිය යුතුය.

6. තමා ගිවිසුම අවසන් කිරීමට අදහස් කරන බව දැක්වෙන දැන්වීමක් එක් එක් පාර්ශ්වය විසින් අනෙක් පාර්ශ්වය වෙත හත් දවසකට කලින් භාර දීමෙන් එය අවසන් කළ හැකිය. එය එසේ අවසන් කරනු ලැබූ විටක, අලුත් ගිවිසුමක් ඇතිකරගන්නා තුරු, ස්ථානය අයිතිකරු විසින් වෙනම සේවාවක් උපයෝගී කර ගැනීමට හිමිකම් නොලැබිය යුතුය.

7. ජල මීටරය හා එහි පිරිද්දුම්වල සුරක්ෂිතභාවය ගැන වගකීමට අයිතිකරු තවදුරටත් පොරොන්දු වන අතර ඒවාට සිදුවන යම් හානියක් හෝ අලාභයක් පිරිමසා දීමට ඔහු එකඟවෙයි.

8. මේ ස්ථානයට නොකඩව ජලය සැපයීම සහතික නොකෙරෙන අතර ප්‍රධාන නලවල පීඩනය මඳවීම හේතුකොටගෙන හෝ වෙන යම් කරුණක් හේතුකොටගෙන සැපයීම ඇනහිටි විටක එකී ස්ථානයට ජලය ප්‍රවාහණය කිරීමට සභාව බැඳී නොසිටියි.

9. එකී ස්ථානයේ පදිංචිකරුවන්ගේ වෙනසක් සිදුවීමට ආසන්න කවර විටක වුවද අයිතිකරු විසින් විධිමත් ලෙස දැන්වීමක් කළ යුතු අතර සභාව සමඟ අලුත් ගිවිසුමක් ඇති කර ගන්නාතුරු කිසිම පදිංචිකරුවකු සේවාව උපයෝගී කර ගැනීමට හිමිකම් නොලැබිය යුතුය.

.......................................
ස්ථානය අයිතිකරු.

සාක්ෂිකරුවෝ :

1.

2.

................................................................ වීදියේ අංක ................ දරන ස්ථානය

.......................................
මහනුවර මහා නගර සභාව වෙනුවෙන්,
ජල කර්මාන්ත ඉංජිනේරු තැන.

19.............................. වැනි දින,
මහනුවර,
මහා නගර සභාවේ දී ය.

(4අ වැනි නියෝගය).

"ඌ". ආකෘතිය

ගෘහ්‍ය කාර්යයන් සඳහා ජලය සැපයීම පිණිස වූ ගිවිසුමෙහි ආකෘතිය

(අයිතිකරු නොවූයෙන් මෙහි මින් මතු "පදිංචිකරු" යනුවෙන් හඳුන්වනු ලබන) ................................................... එක් පාර්ශ්වයකට ද මහනුවර මහා නගර සභාව අනික් පාර්ශ්වයට ද ඇති ව ........................................ පිහිටි අංක ........................... දරන ස්ථානයට ගෘහ්‍ය කාර්යයන් සඳහා මීටර් මාර්ගයෙන් හෝ අන් ලෙසකින් ජලය සැපයීම පිණිස ඇති කර ගන්නා ලද ගිවිසුමයි.

2. ගෘහ්‍ය කාර්යයන් සඳහා එකී ස්ථානයට ජලය සැපයීම අනුමත කිරීම සැලකිල්ලට ගෙන, මෙහි මින් මතු සඳහන් කෙරෙන කොන්දේසි පිළිපැදීමට පදිංචිකරු මෙයින් එකඟවෙයි :—

(අ) අඟල් ..................... මීටරයක් මඟින් ජලය සැපයිය යුතුය.

(ආ) මීටර් කුලිය වශයෙන් පදිංචිකරු විසින් මහනුවර මහා නගර සභාවට රුපියල් .................. ත්‍රෛමාසික ව ගෙවිය යුතුය; නැතහොත් ගෙවීමට සැලැස්විය යුතුය.

(ඇ) එක් එක් මාසය තුළ සපයන ලද ජල ප්‍රමාණය වෙනුවෙන් ගැලුම් දහසකට රුපියල් .................. බැගින් පදිංචිකරු විසින් මහනුවර මහා නගර සභාවට ගෙවිය යුතුය; නැතහොත් ගෙවීමට සැලැස්විය යුතුය.

3. සේවා සම්බන්ධ කිරීම, මීටරය හෝ මීටර් ස්ථාපනය කිරීම සහ ඒවාට අනාගතයේදී කරනු ලබන අලුත්වැඩියා කිරීම් සියල්ල ද පිළිබඳ තක්සේරු කළ පිරිවැය, මහා නගර සභාවේ ජල කර්මාන්ත ඉංජිනේරු තැන විසින් ඉල්ලා සිටි කල්හි, පදිංචිකරු විසින් ගෙවිය යුතුය.

4. මීටර් කුලිය හෝ සපයන ලද ජලය සඳහා වූ ගාස්තුව ගෙවිය යුතු දින සිට දින තිහක් ඇතුළත මහා නගර සභාව වෙත ගෙවනු නොලැබුවහොත් වෙනම සේවාවක් ලැබීමේ අයිතිවාසිකම අහිමි විය යුතු අතර මහා නගර සභාව විසින් සැපයුම නවත්වා දැමිය හැකිය.

5. කොළඹ මහා නගර සභා ජල කර්මාන්ත ආඥාපනතේ විධිවිධාන හා ඒ යටතේ පනවන ලද නියෝගවල විධිවිධාන මහනුවර මහා නගර සභාවට අදාළ වන තාක්, ඒවා මේ ගිවිසුමේ කොටසක් ලෙස ගත යුතු අතර ඉන්පසු එකී ආඥාපනතේ වගන්ති කිසිවක් යටතේ සෑදිය හැකි යම් නියෝගවලින් ද මේ ගිවිසුමේ පාර්ශ්වකරුවන් බැඳී සිටිය යුතුය.

6. තමා ගිවිසුම අවසන් කිරීමට අදහස් කරන බව දැක්වෙන දැන්වීමක් එක් එක් පාර්ශ්වය විසින් අනෙක් පාර්ශ්වය වෙත හත් දවසකට කලින් භාරදීමෙන් එය අවසන් කළ හැකිය. එය එසේ අවසන් කරනු ලැබූ විටක, අලුත් ගිවිසුමක් ඇතිකරගන්නාතුරු ඒ ස්ථානයේ කුලී නිවැසියා විසින් වෙනම සේවාවක් උපයෝගී කර ගැනීමට හිමිකම් නොලැබිය යුතුය.

7. ජල මීටරය සහ එහි පිරිද්දුම්වල සුරක්ෂිත භාවය ගැන වගකීමට පදිංචිකරු තවදුරටත් පොරොන්දු වන අතර ඒවාට සිදුවන යම් හානියක් හෝ අලාභයක් පිරිමසා දීමට ඔහු එකඟවෙයි.

8. පදිංචිකරු විසින් මහනුවර මහා නගර සභාවේ රු.................ක් වූ මුදලක් මෙයින් තැන්පත් කරනු ලබන අතර එකී මුදල ජල මීටරය සම්බන්ධයෙන් ගෙවිය යුතු යම් මුදලකට හා පදිංචිකරුගෙන් සභාවට අය විය යුතු වෙනත් ගාස්තු කිසිවකට හිලව් කළ හැකිය.

9. මේ ස්ථානයට නොකඩව ජලය සැපයීම සහතික නොකෙරෙන අතර ප්‍රධාන නලවල පීඩනය මඳවීම හේතුකොටගෙන හෝ වෙනයම් කරුණක් හේතුකොටගෙන සැපයුම් ඇනහිටි විටක එකී ස්ථානයට ජලය ප්‍රවාහණය කිරීමට සභාව බැඳී නොසිටියි.

10. පදිංචිකරු මෙම ස්ථානයෙන් ඉවත්ව යාමට අදහස් කරන කවර විටක වුවද ඔහු විසින් සභාව වෙත විධිමත් දැන්වීමක් කළ යුතුය. එවිට අලුතෙන් එන පදිංචිකරු විසින් සභාව සමඟ අලුත් ගිවිසුමක් ඇති කර ගන්නාතුරු සභාව විසින් ජල සම්පාදනය කපා හැරීමට හිමිකම් ලැබිය යුතුය.

..........................................

ස්ථානයේ කුලී නිවැසියා/පදිංචිකරු.

සාක්ෂිකරුවෝ :

1.

2.

..............................වීදියේ/පාරේ අංක..................

මහනුවර මහා නගර සභාව වෙනුවෙන්, ජලකර්මාන්ත ඉංජිනේරුතැන.

197...................................මැයි දින,

මහනුවර,

මහා නගර සභාවේදීය.

4 වැනි නියෝගය.

"ඒ" ආකෘතිය

ගෘහ්‍ය නොවන කාර්යයන් සඳහා ජලය සැපයීම පිණිස වූ ගිවිසුම් ආකෘතිය

(මෙහි මින් මතු "පදිංචිකරු" යනුවෙන් හඳුන්වනු ලබන)............................ එක් පාර්ශ්වයකට ද මහනුවර මහා නගර සභාව අනෙක් පාර්ශ්වයට ද ඇති ව, ගෘහ්‍ය නොවන කාර්යයන් සඳහා ජලය සැපයීම පිණිස ඇති කර ගන්නා ලද ගිවිසුමයි.

2. ගෘහ්‍ය නොවන කාර්යයන් සඳහා, එනම්, (අ), (ආ), ආදිය සඳහා එකී ස්ථානයට ජලය සැපයීම අනුමත කිරීම සැලකිල්ලට ගෙන, මෙහි මින් මතු සඳහන් කෙරෙන කොන්දේසි පිළිපැදීමට .................................................................... වන පදිංචිකරු මෙයින් එකඟවෙයි:—

(අ) අඟල්........................මීටරයක් මගින් ජලය සැපයිය යුතුය;

(ආ) ත්‍රෛමාසික මීටර් කුලිය වශයෙන් පදිංචිකරු විසින් මහනුවර මහා නගර සභාවට රුපියල්........................ ක් වූ මුදලක් කල් තියා ගෙවිය යුතුය; නැතහොත් ගෙවීමට සැලැස්විය යුතුය;

(ඇ) එක් එක් මාසය තුළ සපයන ලද ජල ප්‍රමාණය වෙනුවෙන් ගැලුම් දහසකට රුපියල්........................බැගින් පදිංචිකරු විසින් මහනුවර මහා නගර සභාවට ගෙවිය යුතුය; නැතහොත් ගෙවීමට සැලැස්විය යුතුය; පළමුවැනි ගෙවීම.......................................................................
..............................පළමුවැනි දින කළ යුතුය.

3. මීටර් කුලිය හෝ සපයන ලද ජලය සඳහා වූ ගාස්තු ගෙවිය යුතු දින සිට දින පහළොවක් ඇතුළත මහා නගර සභාව වෙත ගෙවනු නොලැබුවහොත් සේවාව උපයෝගි කර ගැනීමේ අයිතිවාසිකම අහිමිවිය යුතු අතර මහා නගර සභාව විසින් සැපයුම නවත්වා දැමිය හැකිය.

4. කොළඹ මහා නගර සභා ජල කර්මාන්ත ආඥාපනතේ විධිවිධාන හා ඒ යටතේ පනවන ලද නියෝගවල විධිවිධාන මහනුවර මහා නගර සභාවට අදාළ වනතාක් ඒවා මේ ගිවිසුමේ කොටසක් ලෙස ගත යුතු අතර මින් පසු එකී ආඥා පනතේ වගන්ති කිසිවක් යටතේ සෑදිය හැකි යම් නියෝගවලින් ද මේ ගිවිසුමේ පාර්ශ්වකරුවන් බැඳී සිටිය යුතුය.

5. තමා ගිවිසුම අවසන් කිරීමට අදහස් කරන බව දැක්වෙන දැන්වීමක් එක් එක් පාර්ශ්වය විසින් අනෙක් පාර්ශ්වය වෙත.............................................. දවසකට කලින් භාරදීමෙන් එය අවසන් කළ හැකිය. එය එසේ අවසන් කරනු ලැබූ විටක, අලුත් ගිවිසුමක් ඇති කරගන්නාතුරු, ස්ථානය අයිතිකරු විසින් වත් එහි පදිංචිකරු විසින් වත් සේවාව උපයෝගී කර ගැනීමට හිමිකම් නොලැබිය යුතුය.

6. ජල මීටරය හා එහි පිරිද්දුම්වල සුරක්ෂිතභාවය ගැන වගකීමට පදිංචිකරු තම දුරටත් පොරොන්දු වන අතර ඒවාට සිදුවන යම් හානියක් හෝ අලාභයක් පිරිමසා ලීමට ඔහු එකඟ වෙයි.

7. පදිංචිකරු විසින් මහනුවර මහා නගර සභාවේ රු. ................................ක් වූ මුදලක් මෙයින් තැන්පත් කරනු ලබන අතර එකී මුදල ජල මීටරය සම්බන්ධයෙන් ගෙවිය යුතු යම් මුදලකට හෝ පදිංචිකරුගෙන් සභාවට අයවිය යුතු වෙනත් ගාස්තු කිසිවකට ගිලවී කළ හැකිය.

19 ........................ක් වූ ...... ................. මස ........................
වැනි දින මහනුවරදී අත්සන් කරන ලදී.

..............................
පදිංචිකරු

............................................................
මහනුවර මහා නගර සභාව වෙනුවෙන්,
ජලකර්මාන්ත ඉංජිනේරු තැන.

අත්සන්වලට සාක්ෂි :

1. ......................................................

2. ......................................................

ජාතික රාජ්‍ය සභාවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500. රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත පමණද දායක මුදල් භාරගනු ලැබේ.